1st Place Winner
National Productivity
Award 2020

SLSI SYSTEM CERTIFIED ISO 9001

SLAB ACCREDITED
ISO/IEC 17021
QMS-001-01

# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

| මගේ අංකය எனது இல. My Ref. | CSS/7/11/03/04 | ඔබේ අංකය உமது இல Your Ref. | | දිනය திகதி Date | 2025.02. 18 |
|---|---|---|---|---|---|

1. ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,දකුණු පළාත
2. සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය, දකුණු පළාත
3. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, දකුණු පළාත
4. ලේකම්, ප්‍රධාන/ අධ්‍යාපන/ කෘෂිකර්ම/ක්‍රීඩා/ ධීවර අමාත්‍යාංශය, දකුණු පළාත
5. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම් හා මෙහෙයුම්/ඉංජිනේරු සේවා), දකුණු පළාත
6. සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දකුණු පළාත

**විගණන විමසුම්වලට අදාළව ඉදිරිපත් කරනු ලබන පිළිතුරුවල, ප්‍රධාන ලේකම් පිටපත විද්‍යුත් තැපැල මගින් ගෙන්වා ගැනීම.**

භාණ්ඩාගාර ලේකම් විසින් 2024.01.10 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය වියදම් පාලනය මැයෙන් යුතු අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3.3 වගන්තිය අනුව ඔබ ආයතනය වෙත ජාතික විගණන කාර්යාලය විසින් යොමු කරනු ලබන විගණන විමසුම් සඳහා ඔබ කාර්යාලය විසින් සපයනු ලබන පිළිතුරුවල ප්‍රධාන ලේකම් පිටපත් ඉලෙක්ට්‍රොනික් cloud space හි ගබඩා කිරීමට තීරණය කර ඇත.

02. ඒ අනුව ජාතික විගණන කාර්යාලය විසින් ඔබ ආයතනය වෙත යොමු කරනු ලබන විගණන විමසුම් සඳහා සකස් කරනු ලබන පිළිතුරු අදාළ සනාථයන් ද සමග දෘඩ පිටපත් වශයෙන් මින් ඉදිරියට මුදල් දෙපාර්තමේන්තුවට එවීමෙන් වළකින ලෙසත්,මින් මතුව ඒ සම්බන්ධව පහත පරිදි කටයුතු කරන ලෙසත් මෙයින් කාරුණිකව දන්වමි.

1. **ජාතික විගණන කාර්යාලය වෙත යොමු කරනු ලබන විගණන විමසුම් සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරී / ගණන්දීමේ නිලධාරී විසින් අත්සන් තබන ලද පිළිතුර අදාළ සනාථනයන් ද සමඟින් Scan කර, depoffinance7@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතු ය.**
2. **පිටපත විද්‍යුත් ලිපිනයට යොමු කිරීමේදී "Subject" හි විගණන විමසුම් අංකය සහ ආයතනයේ නම සඳහන් කළ යුතු ය.**

3. විගණන විමසුමේ පිළිතුරු පිටපත ජාතික විගණන කාර්යාලය වෙත තැපැල් කරන ලද දිනම මුදල් දෙපාර්තමේන්තුවේ විද්‍යුත් තැපැල් ලිපිනයට යොමු කර, ඒ පිළිබඳව දුරකථන මඟින් (091-4944007) මුදල් දෙපාර්තමේන්තුවේ අදාළ විෂය නිළධාරියාට දැන්විය යුතුය.

සුමිත් අලහකෝන්
ප්‍රධාන ලේකම්
දකුණු පළාත